# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,101 — 1920ක්වූ අප්‍රෙල් මස 30වෙනි දිනවූ සිකුරාද.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද ප්‍රකාශපත්‍රයයි.

මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය යන එක්සත් රජ්‍යයේද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය රටවලද රාජාභිෂෙක ලත් සමය සංරක්ෂක ශෙනකශ්‍රීන් විරාජමානවූ පස්වෙනි ජෝර්ජ් රජ්ජුරුවන්වහන්සේගේ නාමයෙන්.

අති ගෞරවනීය බාත් යන පඞ්ක්තියෙහි නයිට් කොමාන්ඩර් පදවියද ශ්‍රී ලඞ්කාවිපයේ සහ ඊට අයත් යටත්ප්‍රදෙශවලද වැඩබලන ආණ්ඩුකාර ධුරයද ලත් ශ්‍රීමත් ග්‍රීම් තොම්සන් උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද

ප්‍ර කා ශ ප ත්‍ර ය යි.

ග්‍රීම් තොම්සන්.

"වර්‍ෂ 1910යේ නාගරිකසභා ආඥාපණතේ" 109 (1) සහ 110 (15) යන වගන්තිවල පංගාර්තු යටතේ ගාල්ලේ නාගරික සභාව විසින් සාදනලද මෙහි පහත දක්වන උපාධ්‍යනීති එකී ආඥාපණතේ 109 (3) වෙනි වගන්තියේ පංගාර්තුකර තිබෙන ප්‍රකාර කාරක මන්ත්‍රණසභා ප්‍රාප්ත වැඩබලන ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරන්ට යෙදුනා ඇත.

එබැවින් ඉහතකී ආඥාපණතේ 109 (3) දරණ වගන්තියෙන් වැඩබලන ආණ්ඩුකාර අප කෙරෙහි පවරා තිබෙන බලය කරණකොටගෙන මීට යාකර තිබෙන උප ලෙඛනයේ දක්වන ඉහතකී උපාධ්‍යනීති මෙයින් ස්ථිරකර ප්‍රකාශකරණ බව සියලු දෙනා විසින් දතයුත්තේය.

අප ස්වාමීන්වහන්සේගේ වර්‍ෂයෙන් එක්දහස් නවසිය විස්සක්වූ අප්‍රෙල් මස 1වෙනි දින ඉහතකී ලංකාවිපයේ නුවරඑළියේදී දෙවාවදාරණලදී.

වැඩබලන ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

බී. හෝර්ස්බරෝ,

වැඩබලන මහලේකම්නාරිස් වම්හ.

මහරජතුමාණන් දෙවියෝ රකිත්වා.

---

### උප ලෙඛනය.

---

#### සදහන්කරණලද අතුරුපණත්.

මෙහි පහත දක්වන උපාධ්‍යනීති යම් ප්‍රසිද්ධ ක්‍රීඩාවක් දක්වනකල එහි සිතියම් පෙන්වීමකදී හෝ සිනිමැටොග්‍රැප් නමැති යන්ත්‍රයකින්, මැජික් ලන්තෑරුමකින් හෝ එබඳු වෙනත් භාණ්ඩාදියකින් දෘෂ්ටිය සම්බන්ධ පෙන්වන දේ දක්වීමකදී හෝ නැටුම්, මායම්, විජ්ජා, පිනුම්, මල්ලවපොර, සර්කස් දක්වීමකදී හෝ වෙනත් ස්ටේජ් එකකින් පෙන්වාදෙන සෙල්ලමක් දක්වීම යනාදි ප්‍රසිද්ධ ක්‍රීඩාවල් සම්බන්ධව භාවිතා වේ.

#### අර්ථ විස්තරකිරීම.

"ලයිසන්ස් සී." යන්නෙන් 4වෙනි උපාධ්‍ය නීතියේ ප්‍රකාර ලයිසන්ස්එක හෙවත් අවසරපත්‍රය අත්සන්කළ අය හෝ අයවළුන් හැටියට තේරුම්ගත යුතුය.

"චෙයාර්මෑන්" යන්නෙන් ගාල්ලේ නාගරික සභාවේ සභාපතිතුමා හැටියට තේරුම් ගතයුතුය.

#### අවසර ගතයුතු ගොඩනැගිලි.

1. කිසි කෙනෙකුට යම් ගොඩනැගිල්ලක්, කොරටුවක් හෝ ස්ථානයක් ප්‍රසිද්ධ ක්‍රීඩාවක් පෙන්වීම සඳහා ඒගැණ අවසර පත්‍රයක් ලබාගෙනොගෙණ පාවිච්චිකරන්ට හෝ එසේ පාවිච්චිකරන්ට ඉඩවක් දෙන්ට බැරිය. තවද අවසර පත්‍රයක් ලබාගත් කෙනෙක් මෙහි කිසියම් උපාධ්‍ය නීතියක් කඩකර පාවිච්චි නොකළ යුතුය. ඊට ඉඩවත් නොදිය යුතුය.

2. එබඳු ප්‍රසිඬ ක්‍රිඩාවක් පැවැත්වීම පිණිස ගොඩනැගිල්ලකට, කොරටුවකට හෝ ස්ථානයකට අවසරපත්‍රයක් ලබාගැණීමට කැමති සෑමදෙනාම සභාපතිතුමාගෙන් මෙහි සඳහන්වූ කරුණු සහිතව ඉල්ලුම්පත්‍රයකින් ඉල්ලාසිටින්ට ඕනෑය. ඒනම් :—

(1) එබඳු ගොඩනැගිල්ල, කොරටුව හෝ ඉඩම පිහිටා තිබෙන ස්ථානය.

(2) එහි විස්තර සහ එය ගොඩනගා තිබෙන්නේ මොන ද්‍රව්‍යවලින්ද යනවග.

(3) එකී අවසරපත්‍රය ලබාගැණීමට ඕනෑකරන ගොඩනැගිල්ල යනාදියේ අයිතිකාරයාගේ නම සහ ස්ථිරවූ ඇඩ්‍රැස්එක.

(4) එකී අවසරපත්‍රය ලබාගැණීමට ඕනෑකරන ගොඩනැගිල්ල යනාදිය ගැණ වගකියන්නාවූ කළමනාකාරයාගේ නම සහ ස්ථිරවූ ඇඩ්‍රැස්එක.

(5) එකී අවසරපත්‍රය ඉල්ලුම්කරයාගේ නම සහ ස්ථිරවූ ඇඩ්‍රැස්එක. එකී අවසර ලබන්ට යෙදෙන ගොඩනැගිල්ල යනාදියෙන් ඔහුට තිබෙන්නාවූ අයිතිවාසිකමේ ස්වභාව සහ ප්‍රමාණය.

(6) එකී ගොඩනැගිල්ල යනාදිය පාවිච්චිකරන්ට අදහස්කරසිටින්නේ මොන අන්දමේ ක්‍රිඩා පෙන්වීමටද යනවග.

(7) අවසරපත්‍රය ඕනෑකරන්නාවූ කාලය.

(8) එකී ගොඩනැගිල්ල යනාදිය තුළ සිටින්ට පුළුවන් අයවලුන්ගේ ගණන තවත් සභාපතිතුමා විසින් ඕනෑකරන්නාවූ තොරතුරු, එසේ අවසරපත්‍රය ලබාගන්ට ඕනෑකරන්නාවූ ගොඩනැගිල්ලේ උසමට්ටමද කාමර ගණනද ප්ලෑන දෙකකින් යුක්තවද, එකී ගොඩනැගිල්ල යනාදිය පිහිටා තිබෙන ආකාරයද, ඊට සමීපව තිබෙන ගොඩනැගිලි සහ ප්‍රසිඬ වීථියද පෙන්වා ප්ලෑන් දෙකක්ද ඉල්ලුම්පත්‍රයට අමුනා දෙන්ට ඕනෑය.

එකී ප්ලෑන්වල ඉස්තෝප්පු, ඇතුල්වෙන පටුදොරවල්, ප්‍රධාන දොරවල් සහ පිටතට යන දොරවල්වලද පළල සටහන් කර තිබෙන්ට ඕනෑය.

අවසරපත්‍රදීම.

3. අවසරපත්‍රයක් ඉල්ලාදෙන ඉල්ලුම්පත්‍රය සභාපතිතුමාට ලැබුනාම උන්නාන්සේ විසින් නිසිආකාර විභාගකර 5වෙනි උපාඬගනීතියේ සඳහන්කර තිබෙන ගාස්තු ගෙව්වායින් පසු උන්නාන්සේට කල්පනාවෙන පොරොන්දුපිට අවසරපත්‍රයක් දෙනවා ඇත. එම පොරොන්දුනම් :—

එම ගොඩනැගිලි ආදියට ඇතුල්වෙන පාරවල්ද, පිටතට යන පාරවල්වලද පළල සහ ගණනද, එම දොරවල් අරින විදිවත්කමද, එහි ඇතුල්වීමට සෑහෙන වැඩිවූ ගණනද, එහි එලිය තබන ක්‍රමයද, එහි ගිනිඇවිලෙන හෝ පුපුරා ගිනිගන්නාවූ දේවලින් ප්‍රවේසම්කරණ විධිවත්කමද, ගිනි නිවන්ට ඕනෑකරන්නාවූ දේවල් ගැණීමට ඉඩතැබීමද, එහි තුළ දුම්බීම නොහොත් සුරුට්ටු යනාදිය පත්තුකර බීම තහනම්කිරීමද, එහි සුලංගැහීමට ඉඩතිබීමද සඳහන්කරන්නට යෙදෙනවා ඇත.

4. එසේ සභාපතිතුමා විසින් දෙනලද අවසරපත්‍රය මීට යාකර තිබෙන A අක්ෂරය දරන පෝර්මයේ ප්‍රකාර දියයුතුය.

තවද මේ උපාඬගනීතියේ ප්‍රකාර දෙනලද අවසරපත්‍රයක් කල්පනාවෙන හැටියට ඕනෑවිටක අහක්කරගැණීමටද, නැවැත්වීමටද, වෙනස්කිරීමටද සභාපතිතුමාට බලය තිබේ.

5. මෙහි පහත සඳහන්වන ගණන් පිළිවෙලේ හැටියට අවසරපත්‍රයක් දෙන්නට ප්‍රථමයෙන් ඉල්ලුම්කාරයා විසින් ගාස්තු ගෙවන්ට ඕනෑය.

| | |
|---|---|
| දෙසැම්බර් මස 31වෙනි දිනට අන්තිමවෙන මුළු අවුරුද්දකට අවසරපත්‍රයට රු. | 125 |
| එක මාසයකට .. .. .. .. | 25 |
| එක දවසකට .. .. .. .. | 2·50 |

අවසරපත්‍රය අවුරුද්දකට දෙන්නේ ගිනිඇවිලෙන්ට නුපුළුවන් දේවල්වලින් සාදා තිබෙනවාය කියා සභාපතිතුමාට කල්පනාවෙන ගොඩනැගිලිවලට පමණක්ය.

6. මෙහි 4වෙනි උපාඬගනීතියේ ප්‍රකාර අවසරපත්‍රයක් ලැබුවාවූ ගොඩනැගිලි කොරටු ස්ථාන යනාදියට සභාපතිතුමාගේ කැමැත්ත කලින් නොලබා පසුව අමුතුකරන්ට නුපුළුවන.

7. මෙහි පහත සඳහන්වන ක්‍රිඩාවල් පැවැත්වීමට මෙම උපාඬගනීතිවලට විරුඬව තිබුනේවී නමුත් කල්පනාවෙනවා නම් අවසරපත්‍රයක් දෙන්ට සභාපතිතුමාට බලයතිබේ, එනම් :—

(*a*) ගමනේ යන සර්කස්එකක් පෙන්වීමටද.

(*b*) එලිමහනේ ප්‍රසිඬ ක්‍රිඩා පෙන්වීමටද.

(*c*) දෙවෙනි වගන්තියේ ප්‍රකාර අවසරපත්‍රයක් ලබාගැණීමට ඉල්ලුම්පත්‍රයක් නැතුව ගාස්තුවක් ඇතුව හෝ නැතුව හෝ ප්‍රසිඬ ක්‍රිඩා පෙන්වීමට යම් ස්ථානයක් තාවකාලික වශයෙන් පාවිච්චිකිරීමටද.

ගින්නෙන් ආරක්ෂාවීම.

8. අවසරපත්‍රය ලබාපු අය ගිනි නිවන පිණිස ඕනෑකරන්නාවූ උපකරණද, ජල යන්ත්‍ර හෝ පයිප්පද, ජලය පුරවාපු බාල්දිද, බිලැන්කෙට්ටු නොහොත් කම්බිලිද, වියලි වැලිද සභාපතිතුමාට ඕනෑකරන්නාවූ ක්‍රමයට සපයා තිබියයුතුය. තවද එසේ තබන්නාවූ දේ සභාපතිතුමා විසින් නියමකළ ස්ථානවල තැබියයුතුයි. අයිතිකාරයා විසින් ගෙවා සභාපතිතුමා ඒත්තු ගන්නාවූ වගකියයුතු කෙනෙක් එම දේවල් ප්‍රවේසම්කර ඕනෑවූවිටක පාවිච්චියට ගැණීමට සූදානම් හැටියට තිබා ප්‍රවේසම් කිරීමට පත්කරන්ට ඕනෑය. එසේ අවසරපත්‍රය ලබාපු ස්ථානයේ එක දවසකට ඕනෑකරන්නාවූ බූමිතෙල්, පැට්‍රෝල්තෙල්, කැරොසින්තෙල්, කාර්බයිඩ් හෝ වෙඩිබෙහෙත් යනාදී ගිනිඇවිලෙන හෝ පුපුරන දේවල් තබාගොගත යුතුයි.

සිනෙමැටෝග්‍රැප් ගිනි ආරක්ෂාකිරීම.

9. (*a*) සිනෙමැටෝග්‍රැප් යන්ත්‍රය හෝ උපකරණ අවසරපත්‍රය ලත් ගොඩනැගිලි ආදිය තුළ එහි රැස්වී සිටින අය නැවතී සිටින කාමරය තුළ හෝ ගොඩනැගිල්ල තුළ තැබීමට සභාපතිතුමා විසින් ලියවිල්ලකින් දෙනලද අවසරපත්‍රයක් නැතුව තබන්ට බැරිය.

(*b*) එහි වැඩකරණ කාමරය ගිනි නොඇවිලෙන හැටියට පුළුවන්වූ අන්දමකින් සාදන්ට ඕනෑය. එහි පිටතට පෙනෙන කවුළු තුණකට වැඩිය තැබීම නුපුළුවන. ඒවා එකක් හරහට අඟල් 12ට වැඩියෙන් නොතැබියයුතුය. එයින් දෙකක් පින්තූර පෙන්වීමට සහ අනික් එය පෙන්වන අයට බැලීමටද.

(*c*) ඒ කාමරයතුළ හෝ ඒ පිල්ම්එකට අඩි හයකට කිට්ටුව දුම්බීමට ඉඩදෙන්ට බැරිය.

(*d*) එහි වැඩකරණ කාමරය තුළ වියලි වැලි බාල්දියක් සහ බිලැන්කෙට්ටුවක් හෝ කම්බිලියක් තිබෙන්ට ඕනෑය.

(*e*) එහි වැඩකරණ අය ඇතුළුව තුන්දෙනෙකුට වැඩිගණනක් ඒ සෙල්ලම් පෙන්වන වේලාවට එහි ඉන්ට ඉඩ දෙනු නොලැබේ.

(*f*) එම කාමරයට අඩි හයකට කිට්ටුව එය බැලීමට රැස්වෙන අයට ආසන තැබීම නුපුළුවන.

(*g*) ඒ ක්‍රිඩා පෙන්වීමට ඕනෑකරන්නාවූ පිල්ම්ස් පමණක් එහි කාමර තුළ තැබියයුතුය. වැඩිපුර පිල්ම්ස් ප්‍රධාන ගොඩනැගිල්ලෙන් ඉවත්කර තැබියයුතුය.

(h) එම පිල්මිස් ලැන්ටර්න්එකට පාවිච්චිනොකරණ අතරතුරේ ලෝහ පෙට්ටිවල අඩංගුකර තැබිය යුතුය. ලන්තෑරුමෙන් පාස්කරපු පිල්මිස් බොබින්වල තදකර තබා ඇස්බැස්ටෝස්ගහපු පෙට්ටියක එහි වැඩකරණ අනිත් අයෙක් විසින් තැබියයුතුසි. තවද සභාපතිතුමා ඕනෑකරණවානම් එහි තුළ සීනක්කාරම් වතුර වීදුරු බාජනයක පූරවා එලියදෙන ඉලියුමිනන්ට්එකේ රස්නය වලක්වන පිණිස කොන්ඩැන්සර් එක ඉදිරිපිට තබන්ට ඕනෑය.

### සුලං නොහොත් වාතය ලැබීම.

10. එම ගොඩනැගිලි යනාදියෙහි වාතය හමන ලෙස එහි සියලුම සෑහෙනතැන්වලට සුලං කවුළු යනාදිය සභාපතිතුමාට ඕනෑකරණ අන්දමට තැබියයුතුසි. එම සුලං කවුළු සියල්ලම ප්ලෑන් කඩදාසිවල පෙන්වන්ට ඕනෑය.

සෑම අදින කාමරවල පිට බිත්තිවල ජනේල තියෙන්ට ඕනෑය.

### ඇතුල්වෙන සහ පිටවෙන මාගී.

11. තුන්සියයකට වැඩිනොවන ගණනක් රැස්වෙන ගොඩනැගිලිවලට පිටවෙන මාගී දෙකකට අඩුනොවන ගණනක තියන්ට ඕනෑය. ස්ටේජ්එකට වෙනම පිටවෙන මාගී දෙකක් තිබෙන්ට ඕනෑය. අදින කාමරේට පිටවෙන මාගී එකක් තිබෙන්ට ඕනෑය.

(a) සියලුම පිටවෙන මාගී අඩි පහකට අඩුනොවන පළල තිබෙන්ට ඕනෑය. එම මාගී කෙලින්ම හිස් ඉඩමකට හෝ ප්‍රසිද්ධ පාරකට ඇරී තිබෙන්ට ඕනෑය. එකී සෑම මාගීවලට උඩින් අඟල් හතක් මහත පින්තාරුකරපු අකුරුවලින්යුත් දැන්වීම්වලින් පැහැදිලිලෙස දක්වා තබන්ට ඕනෑය.

(b) සියලුම පිටවෙන මාගීවල දොරවල්වලට උඩින් එක එක ලාම්පුව බැගින් සවිකර තිබෙන්ට ඕනෑය. එහි පිටවෙන මාගීය කියා වීදුරුවේ පින්තාරුකර තබන්ට ඕනෑය. එක එක ලාම්පුවක් එලියකිරීම ප්‍රධාන ගොඩනැගිල්ලේ ලාම්පු එලිය කිරීම හා සම්බන්ධයක් නැතුව තිබියයුතුසි.

(c) එහි පිටවෙන මාගී දොරවල්වලින් වහනවානම් එම දොරවල් පිටට ඇරෙන්ට තිබෙන්ට ඕනෑය. එම දොරවල් පිටවෙන මාගීයට බාධානොවන හැටියට එල්ලා නොහොත් සවිකර තබන්ට ඕනෑය.

(d) සියලුම් මාගී නිදහස්ව තිබෙන්ට ඕනෑය. ඒවා මොනුආකාරයකින්වත් හිරනැතුව තිබෙන්ට ඕනෑය.

### කක්කුස්සි සපයාදීම.

12. එකී සියලුම ගොඩනැගිලිවලට පිරිමින්ට වෙනම සහ ස්ත්‍රීන්ට වෙනම සෑහෙනතරමේ කක්කුස්සි තිබෙන්ට ඕනෑය. පිරිමින්ට මුත්‍රකිරීමට ස්ථාන සපයා තිබෙන්ට ඕනෑය.

### ක්‍රීඩාකිරීම ගැණ බලපැවැත්වීම.

13. (a) යම් ප්‍රසිද්ධ ක්‍රීඩාවක් පෙන්වනවාය කියා සභාපතිතුමාට දැනගන්ට ලැබුනුවිට අවසරපත්‍රයක් නැතුව එය පැවැත්වීමට ඉඩදෙන්ට නොසෑහෙනවාය කියා කල්පනා උනිනම් ඒට අවසරපත්‍රයක් ලබනතුරු එය සාමාන්‍ය හෝ විශෙෂ දැන්වීමකින් තහනම්කරන්ට එතුමාට බලය තිබේ.

(b) එසේ 13 (a) උපාංග නීතියේ ප්‍රකාර තහනම්කරනලද ක්‍රීඩා පෙන්වීමක් යම් අයෙකුට ඕනෑවුනිනම් ඔහු විසින් සභාපතිතුමාගෙන් අවසරපත්‍රයක් ඉල්ලන්ට ඕනෑය. එසේ අවසරපත්‍රය ලබනතුරු මොනයම් කෙනෙකුටවත් එසේ ක්‍රීඩා පෙන්වන්ට හෝ ඒ ගැණ අත්උදව් කිරීමටවත් නුපුළුවන. තවද එසේ අවසරපත්‍රය ඉල්ලන අය ඔවුන් විසින් පෙන්වන්ටයන ක්‍රීඩා සෙල්ලමේ විදිවත්කමද, ඔහුගේ නාමයද ඇඩ්රැස්එකද වෙනත් සභාපතිතුමාට ඕනෑකරණ තොරතුරු ඔහු විසින් දියයුතුසි.

14. තවද සභාපතිතුමාට අවසරපත්‍රය ලබාගැණීමට ඉල්ලුම්පත්‍රයක් ලැබුනුවිට එතුමාට හෝ එතුමා විසින් නියම කරණ කෙනෙකුට එම ඉල්ලුම්කාරයා විසින් එම ප්‍රසිද්ධ ක්‍රීඩාව හෝ එහි විදිවත්කම පෙන්වන්ට හෝ නියමයක්කිරීමට බාර කරන්ට ඕනෑය.

15. එසේ 13වෙනි උපාංග නීතියේ සඳහන්වූ ප්‍රකාර ඉල්ලුම්පත්‍රය කල්පනාවටගෙණද 14වෙනි උපාංගනීතියේ සඳහන්වූ හැටියට පෙන්වනලද ක්‍රීඩාවල ප්‍රකාරද බලා සභාපතිතුමා විසින් උන්නාන්සේගේ කැමැත්තේ හැටියට අවසරපත්‍රයක් දෙනවා ඇත. එම අවසරපත්‍රය මීට යාකර තිබෙන B පෝර්මේ ප්‍රකාර වියයුතුසි. එහි ක්‍රීඩාවේ විදිවත්කමද තොරතුරුද එම ක්‍රීඩාව පෙන්වීම ගැන වගකියන අය නොහොත් අයවළුන්ගේ නම්ද, එය පෙන්වන ස්ථානයද වේලාවල්ද, වෙනත් විශෙෂ පංගාර්තුද සඳහන්ව තිබෙන්ට ඕනෑය. එසේ දෙන්ට යෙදුනාවූ අවසරපත්‍රයේ නියමවලට විරුද්ධව මොනයම් කෙනෙකුට එම ක්‍රීඩාව පෙන්වන්ට හෝ ඒට ඉඩදෙන්ට හෝ ඒ ගැණ උදව් උපකාර කරන්ට හෝ නුපුළුවන.

16. එසේ 15වෙනි උපාංගනීතියේ ප්‍රකාර දෙනලද අවසරපත්‍රය ඕනෑවුනිනම් ආපසු ගෙන්වා ගැණීමට හෝ නවත්වා ගැණීමට හෝ වෙනස් කිරීමට හෝ සභාපතිතුමාට පුළුවන.

17. එසේ ප්‍රසිද්ධ ක්‍රීඩාවක් පෙන්වන අයට හෝ එය පෙන්වන්ට කැමති අයට හෝ ඒ ගැණ ගොඩනැගිල්ලකට අවසර පත්‍රය ලබාපු අයට හෝ එයින් එක්කෙනෙකුට හෝ ඒට වැඩි ගණනකට හෝ උන්නාන්සේට හෝ උන්නාන්සේ විසින් නියම කරණ අයෙකුට හෝ අයවළුන්ට හෝ එසේ පෙන්වන හෝ පෙන්වන්ට යෝජනාකර සිටින ක්‍රීඩාව හෝ එයින් යම් කොටසක් හෝ පෙන්වන්ට හෝ කියාකරදෙන්ට නියමකරන්ට සභාපතී තුමාට බලය තිබේ.

18. එසේ යම් ගොඩනැගිල්ලකට අවසරපත්‍ර ලත් අයෙකු විසින් හෝ වෙනයම් අයෙකු විසින් හෝ ප්‍රසිද්ධ ක්‍රීඩාවක් පෙන්වීමගැන එතුමාට ලියවිල්ලකින් එම ක්‍රීඩාව හෝ එයින් යම් කොටසක් හෝ නවත්වන්ට පුළුවන්වා පමණක් නොව උන්නාන්සේට යුතුයකියා වැටහෙන නියම හෝ තහනම්පිට යම් ප්‍රසිද්ධ ක්‍රීඩා පෙන්වීමක් හෝ එයින් කොටසක් හෝ පෙන්වන්ට නියම කරන්ට උන්නාන්සේට පුළුවන.

### වැඩිදෙනා රැස්වීම නැවැත්වීම.

19. (a) ගොඩනැගිල්ල තුළ වාඩිවෙන හරිය සම්පූණ්වූවිට ඒවග අහවා දැන්වීම් ලෑල්ලක හෝ බෝර්ඩ් එකක ලියා පිටත පෙනෙන්ට තැබිය යුතුය. තවද අවසරපත්‍රයලත් අය විසින් 19 (b) උපාංගනීතියේ හැටියට සිටගෙණ සිටින්ට අවසර ලත් අයට ඇර වැඩිමනත් අයට ගොඩනැගිල්ල තුළ ඉන්ට ඉඩනොදිය යුතුය.

(b) ඒගැණම විශෙෂ වශයෙන් පංගාඩම්කර තිබෙන ස්ථානවල හැර වෙන තැන්වල සිටගෙණ ඉන්න අයට ඉන්ට ඉඩ නොදිය යුතුවත් ඇර පිටතට යන මාගී මොන අන්දමකින්වත් අවහිරකරන්ට ඉඩනොදිය යුතුය..

### වහන වෙලාව.

20. යම් විශෙෂ ප්‍රස්ථාවකට සභාපතිතුමාගෙන් ඒ ගැණම අවසරයක් ගෙණ මිස නැතුවානම් උදේ 1කෙන් පසු මොනයම් ක්‍රීඩාවක්වත් නොපැවැත්විය යුතුය.

### හසුරුවා පවත්වාගැනීම.

21. කලමනාකාරතැනට බීලා මත්වී සිටින අයෙක් ඇතුල්කරගන්ටවත් එහි නැවතී ඉන්ට ඉඩදෙන්ටවත් බැරිය.

**විභාගයට ඉඩදීම.**

22. අවසරලත් ස්ථානය තුළ මෙකී උපාධගනීතිවලට එකඟව ක්‍රියාකරණවාද කියා විභාගකිරීමට සභාපතිතුමා විසින් හෝ ගාල්ලේ පොලිස් සුප්‍රින්ටැන්ඩන්ට් උන්නාන්සේ විසින් හෝ ලියවිල්ලකින් බලයදෙන අයවලුන්ට සෑම වේලාවල්වලදීම නිදහස්ව ඇතුල්වීමට ඉඩදිය යුතුය.

**දඬුවම්.**

23. මෙකී උපාධගනීති හෝ මෙම උපාධගනීතියපිට සභාපතිතුමා විසින් කරණ මොනයම් අඥාවක් හෝ තහනමක් කඩකර ක්‍රියාකරණ අය වැරදිකාරයෙක් විමෙන්ද (*a*) රුපියල් පනහා දක්වා වැඩිකළහැකි දඩයකටද, පළමු වරදකාරයාවූ දින පටන් එම කඩකිරීම කෙරීගණ යන කාලයතුළ එක දිනට රුපියල් විසිපහ බැගින් වැඩිකළහැකි දඩයකටද, (*b*) සභාපතිතුමා විසින් ලියවිල්ලකින් කඩකිරීම නවත්වන්නට කියා දෙන දැන්වීම ලැබුනාට පසු වරද කෙරීගණ යන කාලය තුළ එක දවසට රුපියල් විසිපහ බැගින් වැඩිකළ හැකි දඩයකටද දඬුවම් වශයෙන් ඔහු යටත්විය යුතුය.

ඉහතකී උපාධගනීති මහජනයා ඇතුල්නොකරන පුද්ගලික ඉඩමක කරන ක්‍රීඩාවල්වලට භාවිතා නොවේ.

---

ප්‍රසිබ ක්‍රීඩාවල් සම්බන්ධ ආඥාපණතේ 4වෙනි උපාධගනීතිය යටතේ දෙන
A.—පෝර්මේ ආකාර අවසරපත්‍රය.

1. අවසරපත්‍රයලත් අයගේ නම සහ ඇඩ්‍රස් එක :———.
2. අවසරපත්‍රයලත් ගොඩනැගිලි යනාදියෙහි කලමනාකාරයාගේ නම සහ ඇඩ්‍රස් එක :———.
3. අවසරපත්‍රයලත් ගොඩනැගිලි යනාදිය පිහිටා තිබෙන ස්ථානය සහ එහි තොරතුරු :———.
4. අවසරපත්‍රයලත් ගොඩනැගිලි යනාදිය පිහිටා තිබෙන බිම් ප්‍රමාණය :———.
5. එක වරකට ඇතුල්කරන අයවලුන්ගේ ගණන :———.
6. වාඩිවෙන්ට පිළියෙලකර තිබෙන සම්පූර්ණ මහත :———.
7. දොරවල් ඇර තිබෙන්ට ඕනෑ කාලය :———.
8. එය පාවිච්චිකරන්ට ඕනෑ කරුණු :———.
9. සපයාදියයුතු පිටවෙන මාර්ගවල මුලු ගණන :———.
10. ගෙවාපු මුදල් ගණන :———.
11. අවසරපත්‍රය ඉකුත්වෙන දිනම :———.
12. තුන්වෙනි උපාධගනීතියේ ප්‍රකාර සභාපතිතුමා විසින් දෙන්ට යෙදෙන විශෙෂ නියෝගවල් :———.

මෙම අවසරපත්‍රය මෙහි පහත දක්වන පොරොන්දුවලට යටහත්ව දෙනුලැබේ.

(1) සභාපතිතුමාගේ අවසර නැතුව වෙන කෙනෙකුට මෙම අවසරපත්‍රය පවරාදෙන්ට නුපුළුවන.
(2) පස්වෙනි කොලොම්එකේ නියමකර තිබෙන ගණනට වඩා වැඩිදෙනෙක් එකවරකට ඇතුල් නොකළ යුතුය.
(3) උපාධගනීතිවල ප්‍රකාර 9වෙනි කොලොම්එකේ සඳහන්වූ පිටතට යන මාර්ගවල් පවත්වාගත යුතුය.
(4) හත්වෙනි කොලොම්එකේ නියමකර තිබෙන්නාවූ වේලාවල් තුළ මිස වෙන වේලාවලදී අවසරලත් ගොඩනැගිලි යනාදියෙහි දොරවල් ඇර තබන්ට නුපුළුවන.
(5) අටවෙනි කොලොම් එකේ තිබෙන කාරණාවලට ඇර වෙන යම් කාරණාවකට ඉඩම් පාවිච්චි නොකළ යුතුය.
(6) දොළොස්වෙනි කොලොම්එකේ කියාතිබෙන විශෙෂ නියෝගවල් පිළිපැදිය යුතුය.
(7) සුසීලාචාරයට නොහොබිනා කිසියම් පිලිම් එකක්වත් පෙන්වන්ට නුපුළුවන.

ස්ථානය :———. අත්සන :———.
දිනම :———. තනතුර :———.
අවසරලත් අයගේ අත්සන :———.

---

ප්‍රසිබ ක්‍රීඩාවල් සම්බන්ධ ආඥාපණතේ 15වෙනි උපාධගනීතිය යටතේ දෙන
B.—පෝර්මේ ආකාර අවසරපත්‍රයයි.

1. ප්‍රසිබ ක්‍රීඩා පැවැත්වී ගැණ වගකියයුතු අයගේ නාමය :———.
2. ක්‍රීඩාව පෙන්වන ස්ථානය :———.
3. එය පෙන්වන්නේ මොනයම් පැය අතරේද යනු :———.
4. ක්‍රීඩාවේ අන්දම සහ විස්තර :———.
5. අවසරපත්‍රය දෙන මූලාදෑනියා විසින් නියමකරණ වෙනත් විශෙෂ නියෝගවල් :———.

මෙම අවසරපත්‍රය මෙහි පහත සඳහන්කරණ පොරොන්දුවලට යටහත්කර දෙනුලැබේ.

(1) එය දෙන් මූලාදෑනියාගේ අවසරය නැතුව වෙන කෙනෙකුට පවරාදෙන්ට නුපුළුවන.
(2) එම ක්‍රීඩාව 2වෙනි කොලොම්එකේ සඳහන්කර තිබෙන ස්ථානයේ සහ 3වෙනි කොලොම්එකේ සඳහන්කර තිබෙන පැය අතරේ මිස වෙන ස්ථානයක හෝ වේලාවක එය පෙන්වන්ට නුපුළුවන.
(3) 4වෙනි කොලොම්එකේ විස්තරකර තිබෙන ක්‍රීඩාවට වෙනස් එකක් නොපෙන්විය යුතුය.
(4) 5වෙනි කොලොම්එකේ කියා තිබෙන විශෙෂ නියෝගවල් පිළිපැදිය යුතුය.

ස්ථානය :———. අත්සන :———.
දිනම :———. තනතුර :———.

---

**ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.**

**No. 2,554, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ ජූනි මස 14වෙනි දිනවූ සඳුදා පස්වරු 1කුත් 30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පළාතේ පාතදුම්බර කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 10ක්.

සිතියම 6,824. ගම—පලිස්පත්තුවේ බස්නාහිර පලාතේ ගෝනවල. අයිතිකාමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | මිල, අක්කරයක රු. |
|---|---|---|---|---|---|
| 1 | වත්තිගම්මහේලෑ හේන නොහොත් නෙරළුවේ හේන | නෑසිගිය මුනා විල්ලවරම් 1915වේ 72/P. D. පෙත්සම | එලවළු වැවීම පිණිස ස්වල්ප කල කට බදුදී තිබේ | 4 1 24 | 50 |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ ආලම්සා නොහොත් ආදම්ලෙබ්බෙගේ පුත්පිච්චෙලෙබ්බෙ කන්නුලෙබ්බෙ ආලිම්සා. | | | | | | |
| 2 | වත්තිගම්මහේලූ හේන නොහොත් තෙරළුවේ හේන | — | හේන | 0 | 0 | 9 | 50 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව, වරක් මූනා විල්ලවාරම් විසින් අයිතිවාසිකම් කියාහිටිනලදී. | | | | | | |
| 3 | වත්තිගම්මහේලූ හේන නොහොත් තුනරළුවේ හේන | — | පොල්ගස් 4ක් තිබේ ආණ්ඩුවේ ඉඩමෙන් අල්ලාගෙන තිබෙන හරිය අත්හැර තිබේ | 0 | 0 | 8 | 50 |

සිතියම 6,624. ගම—පලිස්පත්තුවේ බස්නාහිර පලාතේ මෙනගැහුවල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඇඹිවිල්ලකැටිය | ආර්. වී. සවරිඅප්පන් | දුංකලවත්ත | 2 | 3 | 26 | 120 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව, ජේම්ස්අප්පු විසින් අල්ලාගෙන තිබේ. (මුල් සිතියම 126,145.) | | | | | | |
| 2 | ඇඹිවිල්ලකැටිය | — | වත්ත, පොල් වවාතිබේ | 0 | 2 | 14 | 300 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව, ඇස්. නල්ලමාඩන් විසින් අල්ලාගෙන තිබේ. (මුල් සිතියම 123,151.) | | | | | | |
| 3 | ඇඹිවිල්ලකැටිය | — | වත්ත, එලවළු වවාතිබේ | 0 | 0 | 30 | 120 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 4 | එම | ආර්. වී. සවරිඅප්පන් | කැලෑව | 0 | 0 | 19 | 120 |

සිතියම 6,633. ගම—පලිස්පත්තුව නැගෙනහිර පලාතේ රඹුක්වැල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඊරියගලේවනාත | රඹුක්වැල්ලේ පදිංචි ඉඩමේගෙදර කළුබන්ඩා | කැලෑව, අත්හරිනලද පාර | 0 | 0 | 10 | 60 |
| 2 | එම | රඹුක්වැල්ලේ පදිංචි දිසානායක මුදියන්සෙලාගේ මාතලේගෙදර හිංගිරල | එම | 0 | 0 | 8 | 60 |

6,732. ගම—පලිස්පත්තුව නැගෙණහිරපලාතේ ගඩ්ඩව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මියනමඩිත්තේහේන | පුංචිබන්ඩා තිවපුකෝරාල | හේන | 0 | 2 | 27 | 50 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, පලාත්වල විස්තර සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවනි.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 2,555, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ ජූනි මස 18වෙනි දිනවූ සිකුරාදා පස්වරු 1.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩදුම්බර කොටසේ පිහිටාතිබෙන බිම්කැබලි 5ක්.

මුල් සිතියම 6,675. ගම—ගම්පහ බස්නාහිර පලාතේ නුගේතැන්න. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | හැවන්කැටියේපතන නොහොත් යකරීගුපතන | ඌරුගල කන්දේවත්තේ පදිංචි පී. මුනියන්ඩි කන්කානි | පතන | 4 | 2 | 2 | 20 |
| 2 | හැවන්කැටියේකැලේ | එම | මූකලාන (ඇලට සහ උල්පතට ඉතුරුකර තිබේ) | 1 | 0 | 31 | —* |
| 3 | එම | එම | මූකලාන | 15 | 3 | 4 | 50 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව. සින්නියා කන්කානම විසින් අල්ලාගෙන තිබේ (ටී. පී. 63,431). | | | | | | |
| 4 | සින්නියාගේවත්ත | — | එනසල් වවා තිබේ | 1 | 0 | 26 | 300 |

සිතියම 6,676. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | හැවන්කැටියේකැලේ | පී. මුනියන්ඩි කන්කානි | මූකලාන | 16 | 0 | 0 | 30 |

* විකුණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණා මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ පිඹුරුවල තොරතුරු සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 2,556, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ ජූනි මස 29වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොටසේ පිහිටා තිබෙන බිම්කැබලි 19ක්.

සිතියම 6,689. ගම—පස්බාගේකෝරළේ වරකාව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කිහුරුදෙනියපතන | නාවලපිටියේ ඒ. ජී. හින්නප්පු | පතන | 1 | 0 | 26 | 55 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව, සෝලන්කන්දවත්ත විසින් අල්ලාගෙන තිබේ. | | | | | | |
| 4 | සෝලන්කන්දවත්ත | — | තේ වත්ත | 0 | 2 | 28 | 300 |

සිතියම 6,701. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | පුස්සේමන්කඩ | ඩබ්ලිව්. ඒ. ජෙන් දවිත්සිංඤෝ | කැලෑව | 0 | 1 | 15 | 80 |
| 3 | එම | එම | පතන | 1 | 3 | 31 | 55 |
| 5 | දඹුබැදිරුප්පේ | තෙබුවන ආචාරිගේ විජේහාමි | පතන (පුස්සේ මන්කඩ ඇලට ඉතුරුකර තිබේ) | 1 | 0 | 8 | —* |

අයිතිකමකියන්නා—ආණ්ඩුව, වන්නිගෙදර උක්කුමැනිකා විසින් අල්ලාගෙන තිබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 6 | පූස්සෙම්මන්කඩ | — | ස්වදේශික වත්ත | 0 | 0 | 31 | 55 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 7 | එම | — | හේන | 0 | 1 | 10 | 55 |

සිතියම 6,759.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලබුම්ගොල්ල | කේ. කේ. අරුනාසලම් පිල්ලේ | පතන (පාරට ඉතුරුකර තිබේ) | 0 | 3 | 33 | —* |
| 2 | එම | එම | පතන | 3 | 1 | 4 | 55 |
| 3 | එම | එම | එම | 34 | 0 | 26 | 55 |
| 4 | එම | — | එම (පාරට ඉතුරුකර තිබේ) | 0 | 0 | 25 | —* |

අයිතිකමකියන්නා—ආණ්ඩුව (ෂැම්රොක් වත්ත විසින් අල්ලාගෙන තිබේ.)

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 5 | ෂැම්රොක්වත්ත | — | තේ වත්ත | 0 | 0 | 19 | 500 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 6 | එම | — | තේවතත (පාරට ඉතුරුකර තිබේ) | 0 | 2 | 26 | —* |
| 7 | එම | — | එම (ෂැම්රොක් වත්ත විසින් අල්ලාගෙන තිබේ) | 0 | 0 | 8 | 500 |
| 8 | එම | — | එම (පාරට ඉතුරුකර තිබේ) | 0 | 0 | 3 | —* |

සිතියම 6,729. ගම—අඹගමුවකෝරලේ අඹගමුව යන ගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | ලනතයාපලමුලහේන | — | පතන (කහවතුර ඔයට ඉතුරුකර තිබේ) | 1 | 0 | 33 | —* |
| 5 | එම | කුල්බෝන්වත්තේ පී. ආර්. ෂැන්ඩි සහ ගල්ලපති මෙරකුෂුගේ චාල්ස් සිංඤෝ | පතන | 6 | 0 | 0 | 75 |
| 6 | එම | — | පතන (පාරට ඉතුරුකර තිබේ) | 0 | 0 | 14 | —* |

සිතියම 6,667. ගම—අඹගමුවකෝරලේ කෙහෙල්ගමුව යන ගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඇඹිරිල්ලේහේන | අඹගහකන්දේ ගමරාල්ලාගේ රන් එකනා | ස්වදේශිකයන්ගේ වත්ත සහ හිරිකැලේ | 4 | 3 | 0 | 40 |

* විකුණනු නොලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ආණ්ඩුව ඒජන්ත උන්නාන්සේගෙන්ද, පලෑන්වල තොරතුරු සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

වම් 1920ක්වූ අප්‍රෙල් මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 2,557, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1920ක්වූ ජූලි මස 9වෙනි දිනවූ සිකුරාදා පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ තුම්පනේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 8ක්.

සිතියම 6,905. ගම—පල්ලේපලාතකෝරලේ වෙලගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව, විහාරේවත්තේ ගෙදර උක්කුවා, බෝදියා සහ නයිදු විසින් අල්ලාගෙන තිබේ. මූ. සි. 160,299.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මුරුංගාකනුවේවත්තේහේන | විහාරේවත්තේගෙදර බෝදියා සහ තවත් අය | අත්හැරදමනලද වතත | 0 | 2 | 14 | 60 |
| 2 | එම | එම | එම | 0 | 1 | 6 | 60 |
| 3 | මුරුංගාකනුවේවත්ත | එම | ස්වදේශිකයින්ගේ වතත පොල්වවා තිබේ | 0 | 0 | 25 | 60 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | වැලිකන්දේමුකලාන | විහාරේවත්තේගෙදර බෝදියා | මහකැලය | 2 | 1 | 9 | 70 |
| 5 | එම | එම | මහකැලය (ගම්සභාපාරට ඉතුරුකර තිබේ) | 0 | 0 | 20 | —* |
| 6 | එම | එම | මහකැලය | 0 | 3 | 5 | 70 |

සිතියම 6,866. ගම—උඩපලාතකෝරලේ මීගහහේන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | බරන්දරගල | මීගහහේනේ පොන්නා විදන දුරයා | මහකැලය | 2 | 1 | 9 | 60 |

සිතියම 6,722. ගම—උඩපලාතකෝරලේ මැදගොඩ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. ඉල්ලම්කාරයා විසින් අල්ලාගෙන තිබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1A | නිසිදකදෙනියේපිල්ලෑව | දුනුසිංහමුදියන්සෙලාගේ පුංචිබන්ඩා | හිරිකැලේ | 0 | 0 | 25 | 50 |

* විකිණීමට නොවේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ප්ලෑන්වල තොරතුරු සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

වම් 1920ක්වූ අප්‍රෙල් මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 2,558, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1920ක්වූ ජූලි මස 21වෙනි දිනවූ බදාදා පෙරවරු 1.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතහේවාහැටේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 2ක්.

සිතියම 6,652. ගම—ගන්දහයකෝරලේ හාරගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කුකුල්තුනේ | මසිලපිටියේ ගල්ලිද පදිංචි හිදගොඩමුදියන්සෙලාගේ පුංචිබන්ඩා | මූකලාන | 3 | 1 | 7 | 80 |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 6,956. ගම—හේවාහිස්සකෝරලේ පල්ලේමාඹය. | | | | |
| 1 | කුඹුකේවෙලමූකලාන .. | මහනුවර එච්. බී. අන්ද්‍රිස් .. | මූකලාන .. | 8 2 19 | 80 |

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණා මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද දැනගන්ට පුළුවන.

වර්‍ෂ 1920ක්වූ අප්‍රේල් මස 23වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,655, S. P.**—දකුණු දිසාවේ මාතර උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1920ක්වූ ජූලි මස 3වෙනි දිනවූ සෙනසුරාදා උදේ 11ට මාතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර පලාතේ වැලිගම්කෝරලේ සහ වැල්ලබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

සිතියම 10,884. ගම—ගංගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 7 | නාකන්දේගොඩ .. | — .. | බැද්ද .. | 15 2 24 | 65 |
| 15 | එම .. | ජේ. ඩබ්ලිව්. සමරසිංහ .. | එම .. | 10 2 17 | 65 |
| | සිතියම 11,171. ගම—දන්දෙනිය. | | | | |
| 2 | ඉහලහේනේකොස්ගහහේන .. | සී. ජේ. ගුනවර්දන .. | හේන .. | 20 2 0 | 60 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා මාතර උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1920ක්වූ අප්‍රේල් මස 23වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,656, S. P.**—දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනිම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1920ක්වූ ජූනි මස 16වෙනි දිනවූ බදාදා දවල් 10ට තංගල්ලේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බටහිර ගිරුවාපත්තු කොඩාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 38ක්.

මුල් සිතියම 52. ගම—වරාපිටිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 19A1 | කරදියහේන .. | කැපියපේගේ දුවිත්හාමි .. | හේන .. | 1 1 15 | 16 |
| 31 | කැබැල්ලකැපියෙහේන නොහොත් මහහේන | ජී. ඩී. රත්නතුංග විසින් අල්ලන් තිබෙන කැල්ල | රබර් වත්ත .. | 7 3 37 | 20 |
| | | | වැවිල්ල .. | — | 50 |
| 31A | එම .. | එම .. .. | පාරට ඇරපූ කෑල්ල | 0 0 6 | —* |
| 31B | වැවගාවලියද්ද .. | දොන් සාමෙල් මූනසිංහ විසින් අල්ලන් තිබෙන කැල්ල | කුඹුර .. | 0 0 12 | 25 |
| | මුල් සිතියම් 72. ගම—කැබැල්ලකැපිය. | | | | |
| 19 | ගෝනාගාවහේන නොහොත් කොස්ගහහේන | — .. .. | වත්ත .. | 2 0 36 | 16 |
| | | | වැවිල්ල .. | — | 16 |
| 19A | එම .. | අයි. ජී. දොන් අන්ද්‍රිස් .. | වත්ත .. | 2 0 4 | 16 |
| | | | වැවිල්ලට .. | — | 25 |
| | මුල් සිතියම 133. ගම—කරීවිලකන්ද. | | | | |
| 20E | කහබිලියාවෙහේන නොහොත් කහබිලියාවේහේනේවත්ත | කේ. අප්පුවා .. .. | වත්ත .. | 1 0 1 | 16 |
| | | | වැවිල්ලට .. | — | 10 |
| 35E | ඉමලේහේන .. | කේ. බබාඅප්පු .. .. | වත්ත .. | 1 0 10 | 16 |
| | | | වැවිල්ලට .. | — | 1 |
| | මුල් සිතියම 138. ගම—පන්ගන්විලයායේ. | | | | |
| 1B | උළුවත්ත .. | ජේ. බාලප්පුහාමි .. .. | හේන .. | 0 2 0 | 16† |
| 1C | ලිදගාවවත්ත නොහොත් බෝගහවත්ත | එම .. .. | වත්ත .. | 2 3 38 | —† |
| | | | වැවිල්ලට .. | — | 200 |
| | | | ගෙට .. | — | 300 |
| 1D | එම .. | එම .. .. | වත්ත .. | 0 0 6 | 16† |
| | මුල් සිතියම 140. ගම—ආරබොඩ. | | | | |
| 30H | නියදගලහේන .. | ඒ. දිනෙස්හාමි .. .. | වත්ත .. | 1 1 26 | 16 |
| | | | වැවිල්ලට .. | — | 34 |
| 30J | දෙකන්දහේන නොහොත් වෙරළුපඳුරගාවයාවහේන | ඩබ්ලිව්. ඒ. දොන් දවිත් .. | බැද්ද .. | 2 0 7 | 16 |
| 30L | දන්කොරටුව .. | ජේ. එච්. සමන්චිහාමි .. | එම .. | 0 3 15 | 16‡ |
| 30N | එම .. | — .. .. | එම .. | 0 2 22 | 16§ |
| 30P | දෙකන්දේහේන .. | — .. .. | එම .. | 3 2 0 | 16 |
| 30R | දෙකන්දේහේනවත්ත .. | ඩබ්ලිව්. එවිස්හාමි .. .. | වත්ත .. | 2 0 36 | 16 |
| | | | වැවිල්ලට .. | — | 27 |
| 30S | දෙකන්දේහේන .. | ජේ. එච්. දොන් නිකුලස් .. | බැද්ද .. | 3 0 24 | 16 |
| 32A | දන්කොරටුව .. | ජේ. එච්. සමන්චිහාමි.. .. | එම .. | 0 0 38 | 16 |
| 32B | එම .. | — .. .. | එම .. | 0 0 39 | 16 |
| | මුල් සිතියම 147. ගම—වතුකන්ද. | | | | |
| 1 | බොරළුකැටියේහේන නොහොත් මුලන්ගොඩැල්ල | කේ. වී. සියදොරිස්හාමි .. | වත්ත .. | 0 2 24 | 16† |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 5G | බොරළුකැටිය නොහොත් මුලන්ගොඩැල්ලේවත්ත | කේ. වී. සියදෙරිස්හාමි .. | .. වත්ත .. | 1 | 1 | 18 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 20 |
| | | | ගෙට .. | — | | | 5 |

මුල් සිතියම 156. ගම—බුවැල්ලගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1J | පුපුල්ලගොඩැල්ලහේන නොහොත් කොන්චියසිවත්ත | බී. කිරියා .. | .. බැද්ද .. | 1 | 3 | 2 | 16 |
| 1K | දෙල්ගහහේන .. | යූ. එච්. සල්මන් අල්ලන් තිබෙන කැල්ල | පැහිරි .. | 0 | 2 | 25 | 16 |
| | | | වැව්ල්ලට .. | — | | | 15 |

මුල් සිතියම 162. ගම—මෙදගංගොඩ

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 5A | මුත්තසිදෙනියේඅත්මග .. | පී. උන්දිරිස් .. | .. බැද්ද .. | 2 | 2 | 32 | 20 |

මුල් සිතියම 193. ගම—අමුදමුන.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 29E | කහටගහවත්ත .. | ඇම්. පී. අසෝහාමි .. | .. වත්ත .. | 1 | 2 | 28 | 16 |
| | | | වැව්ල්ලට .. | — | | | 5 |

මුල් සිතියම 194. ගම—කටුවන.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 11D | කලඔටුවාවෙිහේන .. | කේ. වී. දවිත් .. | .. වත්ත .. | 1 | 1 | 9 | 15 |
| | | | ගෙට .. | — | | | 5 |
| | | | වැව්ල්ලට .. | — | | | 25 |

මුල් සිතියම 200. ගම—කොහොම්පෝරුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 11D | කොස්වත්තහේන්කැල්ල .. | වී. පී. ජයන් .. | .. හේන .. | 2 | 0 | 5 | 16 |

මුල් සිතියම 201. ගම—දරම්ටිආර.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 25T | කොලොන්ගහවත්ත .. | කේ. දෙන් කරෝලිස් | .. වත්ත .. | 1 | 1 | 10 | 16 |
| | | | වැව්ල්ලට .. | — | | | 92 |
| | | | ගෙට .. | — | | | 15 |

මුල් සිතියම 208. ගම—මිමනකොලදෙනිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1AA | කරනසිදෙනියේවත්ත .. | එච්. දිනෙස්හාමි .. | .. වත්ත .. | 1 | 2 | 2 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 15 |
| 18 | තල්ගහහේන .. | එම .. | .. වත්ත .. | 0 | 1 | 14 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 8 |
| 18A1 | කරන්දෙනියේවත්ත .. | එම .. | .. වත්ත .. | 0 | 0 | 32 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 12 |
| 15B1 | බෝගහහේන .. | වයි. දෙන් දවිත් .. | .. වත්ත .. | 1 | 2 | 1 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 13·25 |
| 15C1 | එම .. | එම .. | .. වත්ත .. | 0 | 1 | 9 | 16† |

මුල් සිතියම 211. ගම—පහල බූකන්දයාය.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 54W | තික්ගහහේන, .. | ඒ. දෙන් දියෝනිස් සහ එච්. ඒ. නිකුලස් හාමි | වත්ත .. | 3 | 1 | 9 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 135 |
| 54Y | බෝගහකොරටුව .. | එම .. | .. වත්ත .. | 3 | 3 | 37 | 16† |
| | | | වැව්ල්ලට .. | — | | | 64 |
